## සතරකන් මන්ත්‍රණය II කොටස - ( පාඩම - 28)

ක්‍රියාකාරකම

1). ''අවස්ථා හා සිද්ධි සිත් කාවදින සේ ඉදිරිපත් කිරීමට උම්මග්ග ජාතික කතාකරුවා සමත් වේ. උදාහරණ තුනක්වත් දක්වමින් මේ අදහස පැහැදිලි කරන්න.

2). මියුලු නුවර අල්ලා ගැනීමට,

1. සතුරු රජවරුන් යොදන උපක්‍රම ද
2. ඒවා නිශ්ප්‍රභා කිරීමට මහෞෂධ පඬිතුමා ගන්නා ක්‍රියාමාර්ග ද

උම්මග්ග ජාතකයේ මැනවින් දැක්වේ.

එක් කරුණකට උදාහරණ දෙකක් දක්වමින් පහදන්න.

## ආචාර්ය සී.ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර - (පාඩම 29)

''මිල කළ නොහැකි අනඝි මුතු ඇටය'' හෙවත් ''නිදහස් අධ්‍යාපනය'' ලාංකේය දරුවන්ට උරුම කර දුන් ක්‍රිස්ටෝපර් විලියම් විජේකෝන් කන්නන්ගර මහතා උපන්නේ 1884 ඔක්තෝම්බර් 13 වැනි දා අම්බලන්ගොඩ රන්දොඹේ ගමෙහි ය. පොදුජන සිසු පරපුරෙහි ජීවිත ආලෝකවත් කිරීමට අනුපමේය සේවයක් කළ'' නිදහස් අධ්‍යාපනයේ පියා'' ලෙස පිදුම් ලැබූ කන්නන්ගර නාමයෙන් අමරණීයත්වයට පත් වූ ජාතික වීරයාණෝ ය.

1). සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර ශිෂ්‍යයා පාසල් දිවියේ දී ලබාගත් ජයග්‍රහණ මොනවා ද?

..........................................................................................................................

..........................................................................................................................

2). එතුමාගේ ජාති මමත්වය හා දේශප්‍රේමය පිළිබිඹු කරන අවස්ථා 3 ක් සඳහන් කරන්න.

..........................................................................................................................

..........................................................................................................................

3). එදා ජාතික නිදහස් ව්‍යාපාරයේ ක්‍රියාකාරී නායකයින් නම් කරන්න.

..........................................................................................................................

..........................................................................................................................

4). මෙම ව්‍යාපාරයට ක්‍රියාකාරී සාමාජිකයෙකු ලෙස කන්නන්ගර මහතා සහභාගි වූයේ කවර ව්‍යාපරයක් මුල්කොට ගෙන ද?

..........................................................................................................................

..........................................................................................................................

5). විදේශිකයකුගේ මුවින් ගිලිහුණු කිසියම් ප්‍රකාශයක් තුළින් කන්නන්ගර චරිතයේ ශ්‍රේෂ්ඨත්වය මැනවින් පැහැදිලි වෙයි. එම ප්‍රකාශය උපුටා දක්වන්න.

...................................................................................................................................

...................................................................................................................................

6). කන්නන්ගර මැතිතුමාගේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා මොනවාද?

...................................................................................................................................

...................................................................................................................................

## <u>මං තනන්නෝ (පාඩම 30)</u>

1). කෙටි කතාව යන්න සරලව නිර්වචනය කරන්න ?

2). කෙටි කතාවක දැකිය හැකි ප්‍රධාන ලක්ෂණ මොනවාද?

3). පහත වචනවල අර්ථය ලියන්න.

   i. කල්පිත
   ii. දෘෂ්ටි කෝණය
   iii. කතා වින්‍යාසය
   iv. සතකාභ්‍යාසය

4). ''මං තනන්නෝ'' කෙටිකතාවේ රචකයා කවුරුන්ද?

5). ''මං තනන්නෝ'' කෙටිකතාවේ තේමාව කුමක්ද?

6). පහත ප්‍රකාශ හරි නම් '✓' ලකුණ ද වැරදි නම් 'x' ලකුණ ද යොදන්න.

   i. නිර්මාණය සඳහා අවශ්‍ය දෑ සිතින් මවා ගැනීම පරිකල්පනය නම්වේ.........................
   ii. සාර්ථක කෙටිකතාවකට හේතුඵල සම්බන්ධතාවය අවශ්‍ය නොවේ............................
   iii. ''මං තනන්නෝ'' කෙටිකතාවේ සමාජ විෂමතා දක්නට නොලැබෙයි......................
   iv. කෙටිකතාවේ සංශිප්ත බව රැක ගැනීමට සංකේත භාවිතය මහෝපකාරී වේ................................